# දුම්මල කැඩීම...........

## නිමලවංශ දසනායක

තොවිල් පවිල් වලටත් බෙහෙතටත් ගැනෙන දුම්මල හැදෙන්නෙ යකහලු, තිනිය, හල්, නවද වගේ ගස් පරණ වෙලා කෘමි සත්තු ඒගස් වල කඳන් විද්දම. මැලියම් වගේ ගහේ කඳ දිගේ බේරෙන මේවා කාලයක් යද්දි ඝන කුට්ටි බවට හැරෙනව.මෙහෙම ඝන වුන දුම්මල අවුරුදු දස් ගනනක් උනත් වෙනසක් නොවී එහෙමම තියෙනව.සමහර පළාත් වල කුඹුරු වලින් බිං දුම්මල හමුවෙනව. ඒ බිම් වනාන්තර විදිහට තියෙද්දි ගස් වලින් වැටුන දුම්මල තමයි ඒ හමුවෙන්නෙ.

වතු පිටි වලින් ආදායමක් ලැබෙන්නෙ නැති අය, ඉස්සර වනාන්තරයෙ පිහිටෙන් ජීවත් වුනා. කැළෑවෙ වැවෙන වේ වැල් කුකුළු වැල් කැපීම , කිතුල් ගස්වල මල් හැදීම,වගේම කැලේ ගස් වලින් වැටෙන දුම්මල එකතු කිරීමෙනුත් මිනිස්සු බඩවියත රැකගත්තා. අපේ ගමෙ එහෙම ගිය අය දැනුත් ජීවතුන් අතර ඉන්නව.
කීපදෙනෙක් එකතුවෙල, වලඳක් පොල්ගෙඩි දෙකතුනක් එහෙම අරන් ඈත වනාන්තරයට යන මේඅය වනාන්තරේට අදිපති දෙවි වරුන්ට කොල අත්තක් කඩල එල්ලල වනාතරේට ඇතුල්වෙනව. යකඩ ඇණත් මිටියකුත් අරන් යන්න අමතක කරන්නෙ නෑ.පාන්දරින් ගෙදරින් පිටත්වෙනමේ අය හවස් වෙද්දි එක තැනක් තෝරගෙන, කෙලින් හිටවපු එක කනුවක් වටේ ඇලයට හිටවූ ලී වලින් හදාගන්නා වාඩිය බේරු කොල වලින් සෙවිලිකරගන්නව. ලේසියෙන් පොත්ත ගැලවෙන ලොකු ගහකින් ගලවගත්තු පොත්තක්, වාඩිය ඇතුලෙ හදපු මැස්ස උඩ එලාගෙන ඒක උඩ තමයි නිදාගන්නෙ. . ලී කැල්ලකින් හිරමනයකුත් හදාගෙන , මොනවහරි රත්කරගෙන කාල නිදාගන්නා මේ අය පසුවදා පාන්දරින්ම දුම්මල හොයන්න පටන්ගන්නව.

තුන් හතර දෙනෙකුටවත් බදන්න බැරි දැවැන්ත ගස්වල නගින්න මේ අය බඳ පොටේ කියන ලනුවකුත් යකඩ ඇණත් යොදාගන්නව.ගහේ ඉහල නගිද්දි ඇණ ගහමින් ඒ ඇණ වලට පය තියමින් ගිහින් නැවත බහිද්දි අර ඇණ ගලවගන්නවලු. දවසක් තරුණයෙක් මේ වගෙ විශාල ගහක නැග්ගට පස්සෙ බඳපොටේ බිමට වැටුනලු.දුම්මල ටික කඩල බිමට දාපු මේ කොල්ලා බහින්න විදිහක් නැතිව කල්පනා කරමින් හිටියලු.ගහේ කඳ දිගේ ඉහලට ගිහින් තිබුනු හීනි වැල් කෙන්දක් දැකල ඒකත් අල්ලගෙන ගහෙන් පැන්නලු පහලට. මිනිහෙක්ගෙ බර උස්ස්සන්න හයියක් නොතිබුනු ඒ වැල අල්ලගත්තෙ ඔලුව ඉහලට හරවගන්න විතරක් බව ඔහු මා එක්කම කියල තියෙනව. ලොකු අබාදයක් නොවී බේරුනු බවත් කිව්වා.සමහර වෙලාවට දුම්මල තියෙන ගහ ලඟින් තියෙන කුඩා ගහක හැර බැඳගෙන ඉහලට ගිහින් තමන් ඉන්න ගහ දුම්මල තියෙන ගහ දිහාවට නවාගන්නව.සමහර වෙලාවට ගස් වලින් බේරුනු දුම්මල බිම එකතුවෙල තියෙන තැනුත් හමුවෙනව.දවස් කීපයක් වෙහෙසිලා එක් එක්කෙනාට ගේන්න පුලුවන් තරම් දුම්මල එකතුකරගෙන අපහු එනව.



මේ වගෙ දුම්මල එකතුකරන්න ගලකට නැගපු දුප්පත් අම්මකෙනෙක් ගැන විමලරත්න කුමාරගම කවියානන් ලියපු මේ කවි පෙලත් කියවල බලන්න.

දුම්මල ගල ඉමේ මහ මූකලානේ
අඳෝනාව ඇ හීගඩු නගන්නේ
කන්දේ පරවේණි උලලේනියන්නේ
රෑ සමයමේ ඇයි මා බය කරන්නේ

අපෙ අම්මා දුම්මල ගලවන්න ගියා
ඒවා මිටිබැඳන් වඳුරඹ පොලට ගියා
හාල් ටිකට පොල් ගෙඩියට ණයක් තියා
කොපි පොතකුයි පැන්සලකුයි ගෙනෙන්නියා

වැහි වැහැලා ගල ආඳා බඩේ උනා
අම්මා එදත් ඒ ගල මුදුනටම උනා
රූටා ගිහින් පාමුල ගලටත් රිදුනා
අම්මා තිවු විලාපය තවමත් ඇසෙනා

ඇලබඩ රුප්පාව ල රෑ හඳපානේ
ඉන්නා කලට මට දුම්මල ගල පෙනුනේ
ලෝබ නැතුව ඔය ගල දුම්මල දුන්නේ

**කුසළ මහිම ජ්‍යෝතිර්විද්‍යා පර්යේෂණායතනය**

196/4A ගාලුපාර පානදුර ශ්‍රී ලංකා

**හෙට්ටිආරච්චිගේ උපාලි පීරිස්**

ජ්‍යෙතිශ විශාරද, ජ්‍යොතිෂ නන්දන, ජ්‍යෙතිර්විද්‍යාරත්න,
කලාභූෂණ, ජ්‍යොතිශ පිළිබඳ බාහිර කථිකාචාර්ය, දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනය
හා හොරණ ශ්‍රීපාලි විශ්වවිද්‍යාලය, දිවයිනටම සාම විනිසුරු

භාව කේන්ද්‍ර සෑදීම
විදේශ කේන්ද්‍ර සෑදීම
සියලුම නැකැත් (දේශීය විදේශීය) සෑදීම
පලාපල - මංගල නැකැත් සෑදීම
වාස්තුවිද්‍යානුකූළව නිවාස සැළසුම් පරීක්ෂා කිරීම

**දුරකතනය 03 8223 9307 / 0726 844 912**

ඊමේල් peirishu@yahoo.com

# උකටලී වූ තෙවන පෙම

නිර්වර්ණ COLOURLESS
උපේක්ෂා සේනානායක

ගිම්හාන කාලයේදී හරිත පැහැයෙන් බැබළුණු තුරු හිස් කළු පාට ඳඬු පමණක් ඉතිරි කරගෙන කාන්සියෙන් ඈත ආකාශය දෙස බලාසිටියි. මීළඟ දුම්රිය එනතුරු දුම්රියපොළේ ඈත බංකුවක හිඳගෙන සිටින තරුණ යුවළ කලබලයෙන් ඈත මෑත දිවයන මගීන්ට විශේෂ දසුනක් නම් නොවීය. කොකේෂියානු මුහුණුවරක් සහිත තරුණයාත් සිහින් දිගු ඇස් ඇති රූබර තරුණියත් බාහිර පෙනුමෙන් කදිමට ගැලපුණු අපූරු යුවළක් බව මට සිතුණි. තරුණයා ඉතාම උනන්දුවෙන් පවසන යමක් තරුණිය අසා සිටියේ උවමනාවට එපාවට මෙනි. ඔහු සිඟිති පරිගනක තිරය මත වූ යමක් ඇයට පෙන්වා සිනාසෙයි. තරුණිය අන් කල්පනාවකය.

දුම්රිය එනතුරු වේදිකාවේ මුල්ලකට වී සීතලේ වෙව්ලමින් සිටි මට වසර ගනනකට පෙර ජයන්ත සර් (ජයන්ත අමරසිංහ) මා අතට පත් කළ ඔහුගේ "කාව්‍ය සේවනය " නම් කෘතියේ තිබූ අනෝමා දමයන්ති නම් කිවිඳියගේ උකටලී වූ තෙවන පෙම කාව්‍ය සිහිවිය.



**නුඹේ කුලුඳුල් පෙමට**
**අහඹු ලෙස පිදූ මගෙ තෙවෙනි පෙම**
**කෙසේ නම් එකිනෙකට සැසඳේද**
**සිතේ මට**

**ඕනෑවට එපාවට**
**හිස් වචන එකතු කොට**
**කරදාසි කෑල්ලක් එවන්නෙමි නුඹ නමට**
**අගනා වස්තුවකි එය නුඹට**
**මේ නුඹේ ප්‍රථම පෙම**

**නුඹ බොහෝ වෙහෙස වී**
**අකුරෙන් අකුරට පිරික්සා**
**එවන සෙනෙහැති හසුන වුව**
**කියවන්න අලස වෙමි**
**උඩින් පල්ලෙන් බලා ඉවත ලමි**
**මේ මගේ තෙවෙනි පෙම**

**කල්ප කාලයකට පසුව**
**අප හමුවන දිනය**
**පෝය දා සඳක් සේ දිලේ නුඹ**
**මේ නුඹේ ප්‍රථම පෙම**

**ඒ සඳේ කිරණින්**
**නොපිබිදෙන කුසුම මම**
**නෙතු පියා නිදන්නට සිතේ මට**
**මේ මගේ තෙවෙනි පෙම**

කාලය සහ සංස්කෘතිය අතින් කොතරම් නොපෑහුණත් අනෝමා දමයන්ති දුටු තරුණ යුවළත් හැලම් දුම්රිය පොළේදී මා දුටු තරුණ යුවළත් අතර කිසියම් සාම්‍යක් මා දකින්නේ ඇයිදැයි මට නොදැනේ. ඇතැම් විට ප්‍රේමය වනාහී සර්වකාලීන සංකල්පයක් වන නිසාද?

මොනතරම් පරස්පරතා තිබුණත් ලෝකයේ කොයි කොන සිටියත් පෙම්වතුන් අතිවිඳින්නේ සදාකාලික වූ ගැටළු සමුදායකටය. වෙනස් වන්නේ ඒවායේ හැඩය සහ සාපේක්ෂභාව පමණි.